"විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம், 32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary: දුරකථන / தொலைபேசி / Telephone 2698409; ෆැක්ස් / தொலைநகல் / Fax 2694667; ඊ-මේල් / மின்னஞ்சல் / Email chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொது தொலைபேசி / General Telephone: 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல. / My No.: CSO/FIN/2/3/6(ii)    ඔබේ අංකය / உமது இல. / Your No.:    දිනය / திகதி / Date: 2016.08.

# මුල්‍ය චක්‍රලේඛ 15/2016

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

## " ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියට අදාලව මුල්‍ය චක්‍රලේඛ 15/2014 හි සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනය සහ උපදේශන සේවා ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටු සීමා නිර්ණය කිරීම.

" ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියට අදාලව පහත සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනයට සහ උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. එම සියලු සංශෝධනයන් 2016.08.01 දින සිට ක්‍රියාත්මක වේ.

### i. 2014.10.03 දිනැති මුල්‍ය චක්‍රලේඛ 15/2014 සංශෝධනය

" ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියට අදාලව පමණක් 2014.10.03 දිනැති මුල්‍ය චක්‍රලේඛ 15/2014 හි ඇමුණුම 01 හි පළාත් ඉංජිනේරු කාර්යාංශයට අදාල ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා සීමා නියම කිරීම යන මැයෙන් දැක්වෙන ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රසම්පාදන කමිටු සීමා පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| අනු අංකය | සංශෝධනය කරනු ලබන කොටස | දැනට ක්‍රියාත්මක වන සීමාව | මෙම ව්‍යාපෘතියට අදාලව පමණක් සංශෝධනය විය යුතු සීමාව |
|---|---|---|---|
| 01. | 2014.10.03 දිනැති මුල්‍ය චක්‍රලේඛ අංක 15/2014 හි ඇමුණුම අංක 01 හි 03 වන කරුණට අදාල "ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රසම්පාදන කමිටුව " | රු.මිලියන 10 දක්වා | රු.මිලියන 20 දක්වා |

ඉහත සංශෝධනය හැර මුල්‍ය චක්‍රලේඛ 15/2014 හි අනිකුත් සියලු කරුණු ඒ ආකාරයෙන්ම බලපැවැත්වේ.

ii. <u>උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන කමිටු සීමා නියම කිරීම.</u>

" ලහම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියට අදාලව පමණක් වාස්තු විද්‍යාත්මක සැලසුම්, ඉංජිනේරු සැලසුම් ආදී උපදේශන සේවා ලබා ගැනීම සඳහා මුල්‍ය චක්‍රලේඛ 15/2014 හි සඳහන් පහත දැක්වෙන ප්‍රසම්පාදන කමිටුවලට ඒ ඉදිරියෙන් දක්වා ඇති මුල්‍ය සීමා යටතේ කටයුතු කිරීමට බලය දෙනු ලැබේ.

| අනු අංකය | කමිටුව | මුල්‍ය සීමාව මුළු පිරිවැය ඇස්තමේන්තු මුදල මත (රු.මිලියන) |
|---|---|---|
| 01 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍රසම්පාදන කමිටුව | 100 දක්වා |
| 02 | ගොඩනැගිලි අධ්‍යක්ෂ ප්‍රසම්පාදන කමිටුව | 20 දක්වා |
| 03 | ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රසම්පාදන කමිටුව | 01 දක්වා |

2) ඉහත කමිටුවල සංයුතිය මුල්‍ය චක්‍රලේඛ 15/2014 හි සඳහන් සංයුතිය වන අතර තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම ආදී අනිකුත් කරුණු සම්බන්ධයෙන් මුල්‍ය චක්‍රලේඛ 15/2014 හි සඳහන් විධිවිධාන ඒ අයුරින්ම බලපැවැත්වේ.

3) මීට අමතරව උපදේශක සේවා ලබා ගැනීමේදී රජයේ පවත්නා රීති රෙගුලාසි හා විධිවිධාන අනුගමනය කිරීමට මෙම කමිටුව විසින් වග බලා ගත යුතුවේ.

ජේ.එම්.ඩී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.පරිගණක දත්ත ක්‍රියාකරු.